
**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 2 | 03. මානව හිමිකම් හා යුතුකම් |






*රුවනි නිරාෂා පතිරගේ*

*බප/හො/දොන් පේද්‍රික් මහා විද්‍යාලය*

# මානව අයිතිවාසිකම් යනු,

- **මිනිසත්බව ලැබීම නිසා කිසිදු භේදයකින් තොරව මිනිසාට උපතින්ම හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ.**



# මානව අයිතිවාසිකම් විශ්වමය සංකල්පයකි

- එය සාධාරණත්වය හා සමානාත්මතා මූලධර්මය මත පදනම් වේ.
- ජාතිය, වර්ගය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ පන්තිය, දරන දේශපාලන මතය ආදී විෂමතාවන් නොසලකා පොදුවේ හැමටම මෙම අයිතිවාසිකම් හිමිවේ.



# මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධ ඓතිහාසික අවස්ථා

- ක්‍රි.ව 1215 බ්‍රිතාන්‍යයේ මැග්නාකාර්ටා ගිවිසුම
- ක්‍රි.ව 1689 බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ක්‍රි.ව 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
- ක්‍රි.ව 1789 මිනිස් හා පුරවැසියන් පිළිබද ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව 1917 රුසියානු විප්ලවය

# අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලිය කරුණු දෙකකින් සමන්විත වේ




# අයිතිවාසිකම් වර්ග



# මානව හිමිකම් සහ එක්සත් ජාතීන්

- ක්‍රි.ව 1945 දී එක්සත් ජාතීන්ගේ සංගමය බිහිවීමට හේතු
- ලෝක සාමය සුරක්ෂිත කිරීම
- ජාතීන් අතර සහයෝගය වර්ධනය කිරීම
- මානව හිමිකම් සුරැකීම


15th Anniversary
HUMAN
RIGHTS
COUNCIL
2006 - 2021


FREEDOM
TRUST
JUSTICE
LOVE
RULE OF LAW
PEACE
PROSPERITY
DIGNITY
EQUALITY

# එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

## ප්‍රධාන අරමුණු

- නීති මගින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දීම අත්‍යාවශ්‍ය බව
- ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා තව දුරටත් වර්ධනය කිරීම අවශ්‍ය බව
- සමාජ ප්‍රගතිය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් උදාකරදීම

**එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වගන්ති තුළින් පිළිගැනෙන අයිතිවාසිකම් 30 සරල බසින් පහත දක්වා ඇත.**

1. සියලු මනුෂ්‍යයෝ නිදහස් ව උපත ලබති. ඔවුහු ගරුත්වය හා අයිතිවාසිකම් වලින් සමාන වෙති.
2. ජාති, ජන වර්ග, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම්, දේශපාලන ආදී කිසිදු භේදයකින් තොර ව විශ්ව ප්‍රකාශනයේ අයිතිවාසිකම් සැමට සමාන ව හිමි වේ
3. ජීවත් වීමට, සිතීමට හා පෞද්ගලික ආරක්ෂාවට ඇති හිමිකම
4. කිසිවකු වහල්භාවයේ (දාසකමේ) නොයෙදවිය යුතු ය.
5. කිසි ම පුද්ගලයකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික දඬුවමකට යටත් නොකළ යුතු ය.
6. නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය

7. නීතිය ඉදිරියේ සියල්ලන් ම සමාන බව හා නීතියේ ආරක්ෂාවට සියල්ලන්ට ම හිමිකමක් ඇතිබව

8. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ දී බලධාරී ජාතික අධිකරණයකින් ප්‍රතිකර්ම යොදා ගැනීමේ හිමිකම

9. බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හෝ පිටුවහල් කිරීම නොකළ යුතු බව

10. තමන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ ව හෝ තමන්ට විරුද්ධව යම් අපරාධ චෝදනාවක් පිළිබඳ ව හෝ සාධාරණ හා අපක්ෂපාතී නඩු විභාගයකට ඇති හිමිකම

11. (I) දණ්ඩන වරදක් සම්බන්ධ ව චෝදනා ලැබ සිටින සෑම පුද්ගලයකු ම වරදකරුවකු බව ඔප්පු වන තෙක් නිර්දෝෂී පුද්ගලයකු ලෙස සැලකීම

(II) දණ්ඩන වරද කළ කාලයේ වලංගු ව පැවති දඬුවමකට වඩා වැඩි දඬුවම් නියම නොකළ යුතු බව

12. පෞද්ගලික රහස්‍යභාවයට ඇති අයිතිය

13. (I) තම රාජ්‍ය සීමාව තුළ නිදහස් ගමනාගමනයට හා පදිංචියට හිමිකම

(II) විදේශගත වීමට හා තම රටට ආපසු පැමිණීමට ඇති අයිතිය

14. ජීවිත ආරක්ෂාව සඳහා විදේශගත වීමේ හිමිකම

15. සෑම පුද්ගලයකුට ම ජාතිකත්වයට හිමිකම් ඇති බව

16. පවුලක් ඇති කිරීමේ හා පවුල සමාජයෙන් හා රාජ්‍යයේ රැකවරණය ලැබීමේ අයිතිය

17. (I) දේපළ පිළිබඳ අයිතිය

(II)කිසිවකු සතු දේපළ බලෙන් අහිමි කළ නොහැකි බව

18. සිතීමේ, හෘද සාක්ෂියේ හා ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය

19. නිදහස් මතය ප්‍රකාශ කිරීමට, තොරතුරු ලැබීමට හා තොරතුරු දීමට ඇති අයිතිය

20. සාමකාමී ව එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය

21. ඍජුව හෝ නිදහස් ව තෝරා ගත් නියෝජිතයන් මඟින් හෝ රජයට සහභාගි වීමට, ඡන්ද බලයට හා රාජ්‍ය සේවයට අයිතිය

22. සමාජ ආරක්ෂාවේ අයිතිය
23. රැකියාවක් කිරීමට, සාධාරණ වැටුප් ලැබීමට හා වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය
24. නිවාඩු සහ විවේක ගැනීමේ අයිතිය
25. ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය සේවා ආරක්ෂාවට ද සමාජ සේවා ආරක්ෂාව හා රැකවරණයට ද ඇති අයිතිය
26. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ප්‍රාථමික හා මූලික අවස්ථාවල දී පමණක්වත් අධ්‍යාපනය නොමිලේ සැපයිය යුතු ය.
27. සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට ඇති අයිතිය
28. මෙම ප්‍රකාශනයෙහි සඳහන් අයිතිවාසිකම් හා ස්වාධීනතා පරිපූර්ණ ව ඉටු කර ගත හැකි සමාජ හා ජාත්‍යන්තර රටාවකට ඇති අයිතිය
29. (I) සෑම පුද්ගලයකු විසින් ම ඉටු කළ යුතු සමාජ යුතුකම් රැසක් ඇති බව
    (II) පුද්ගලයාගේ අයිතිවාසිකම් හා ස්වාධීනතාවන් ක්‍රියාත්මක වීමේ දී සීමාවක් තිබිය හැක්කේ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා ස්වාධීනතා ආරක්ෂා වීම සඳහා ය.
30. ප්‍රකාශනයෙහි ඇති අයිතිවාසිකම් හා ස්වාධීනතා වැනසී යන අන්දමේ ක්‍රියාකාරකම් නොකළ යුතු බව

# මානව අයිතිවාසිකම් පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකිය

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- ආර්ථික සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්



## මානව අයිතිවාසිකම්

### සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

- ජීවත් වීමට, නිදහස් ව සිටීමට හා පෞද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් දාසභාවයෙන් නිදහස් ව සිටීමට ඇති අයිතිය
- කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිළිවලින් මිදී සිටීමේ අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය
- ගමනාගමනයට ඇති නිදහස
- විදේශයක ආරක්ෂාව ලැබීමේ අයිතිය
- සිතීමේ හෘද සාක්ෂියේ හා ආගමික නිදහස
- නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය
- සෘජුව ම හෝ තෝරා ගත් නියෝජිතයකු මගින් තම රටේ පාලනයට සහභාගි වීමට ඇති අයිතිය

### ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- වැඩ කිරීමට ඇති අයිතිය, සමාන වැඩ සඳහා සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය
- වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට හා ඒවාට සම්බන්ධ වීමට ඇති අයිතිය
- නිවාඩු ලබා ගැනීමේ හා විවේක ගැනීමේ අයිතිය
- ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අයිතිය
- සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට සහභාගි වීමට ඇති අයිතිය
- සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
- පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය
- ප්‍රමාණවත් ජීවන තත්වයක් භුක්ති විඳීමට ඇති අයිතිය

# අයිතිවාසිකම් පතා උද්ඝෝෂණ



# සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය - 1966

- එහි දක්නට ලැබෙන සම්මුති කිහිපයක්

- ජීවත් වීමට ඇති අයිතිය
- කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හා වධ හිංසාවලින් මිදී සිටීමට ඇති අයිතිය
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- නීතිය හමුවේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමට ඇති අයිතිය
- අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- පෞද්ගලික නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් මිදී සිටීමට ඇති අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- ආගම් ඇදහීමේ නිදහස
- සාමකාමී ලෙස රැස්වීමේ නිදහස
- මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය
- මහජන නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීමට ඇති අයිතිය

# අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත

ඉහත පනතට අදාලව ප්‍රධාන නීතිමය ලේඛන 6ක් පවතී

1. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
2. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය (1966)
5. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ දෙවන වෛකල්පික සම්මුතිය (1989)
6. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පික සම්මුතිය (2008)

# කාන්තා අයිතිවාසිකම්



- පවුල් ඒකකය තුල කාන්තාව මවක, දියණියක, මිත්තනියක ලෙස කටයුතු කරයි. සමාජය තුල ඇය සෑම ක්ෂේත්‍රයකටම පිවිස සිටින්නීය.









# සමාජය තුල ඇය සෑම ක්ෂේත්‍රයකටම පිවිස සිටින්නීය










# ඈත අතීතයේදී පවා පෙරදිග රටවල කාන්තාව විශේෂ කොට සැලකීය

- කාන්තාව සම්බන්ධයෙන් ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කළ ක්‍රියාමාර්ග
  - අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම
  - විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම



# කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය CEDAW

- එක්සත් ජාතීන් විසින් මෙම සම්මුතිය 1979 දෙසැම්බර් 18 දින සම්මත කරගනු ලැබිනි. එහි තුන්වන වගන්තිය පහත දැක්වේ.

"පාර්ශ්වකාර රාජ්‍යයන් සියලු ම ක්ෂේත්‍රයන්හි, විශේෂයෙන් දේශපාලන, සමාජයීය, ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රයන් හි පුරුෂයින් හා සමතාවය මත පදනම් වූ අයිතිවාසිකම් හා මූලික නිදහස භුක්ති විදීම සහ පිළිපැදීම සහතික කිරීම සදහා ස්ත්‍රීන්ගේ සම්පූර්ණ දියුණුව හා ප්‍රගතිය සහතික කිරීමට අවශ්‍ය නීති සම්පාදනය ඇතුළු සියලු ම ක්‍රියා මාර්ග ගනු ඇත."

# කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය CEDAW යටතේ කාන්තාවන්ට හිමි අයිතීන්

- කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය
- ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය
- සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය
- සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය



## 10 වන වගන්තිය

"පාර්ශ්වකාර රාජ්‍යයන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරුෂයින් හා සමග සමාන අයිතිවාසිකම් ස්ත්‍රීන්ට ලැබීම සහතික කිරීම සඳහා, වෙනස් ලෙස සැලකීම තුරන් කිරීමට අවශ්‍ය සියලු යෝග්‍ය උපාය මාර්ග ගනු ඇත."

## 15 වන වගන්තිය

"පාර්ශ්වකාර රාජ්‍යයන් නීතිය ඉදිරියේ ස්ත්‍රීන්ට පුරුෂයින් හා සමග සම තත්ත්වය දෙනු ඇත."

- ශ්‍රී ලංකාව 1981 දී මෙම සම්මුතියට අත්සන් තබා පිළිගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත

- මෙම සම්මුතියට අනුව 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම
- කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙනම ම අමාත්‍යාංශයක් පිහිටු වීම

- කාන්තාවන්ට වන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව  පිහිටු වීම

- ගැහැණු ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි ව සිදු කරන වැරදි දණ්ඩනීය අපරාධ වශයෙන් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම

- ගැහැණු ළමයින් හා කාන්තාවන්ට ද රැකවරණය සැලසෙන පරිදි ඔවුන්ට එරෙහි ව නිවස තුළ දී සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම

- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම

- 1999 ඔක්තෝබර් 06 දින සිඩෝ සම්මුතිය හා සම්බන්ධ වෛකල්පික ගිවිසුමක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබිණි.

# ළමා අයිතිවාසිකම්

- මල් වැනි දරුවන්















# ළමා අයිතිවාසිකම්


## ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වන අවස්ථා

- ළමා ශ්‍රමිකයන් ලෙස සේවයේ යෙදවීම
- අපයෝජනයට ලක්වීම
- ළමා සොල්දාදුවන් ලෙස කටයුතු කිරීම
- පැහැරගෙනයාම
- පාසල් නොයැවීම
- වධහිංසාවලට ලක් කිරීම









UN WATER
HUMAN RIGHTS
TO WATER AND
SANITATION
UNITED NATIONS






ABUSE OF KIDS HUMAN RIGHTS IN SCHOOLS!
NO! You can't use the toilet, you should have gone in your break!
I am sorry Miss, don't yell at me.
My bladder and bowels do not run to a clock.

# ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ ප්‍රධාන කරුණු 4කි


1. ආරක්ෂාව
2. පැවැත්ම
3. සංවර්ධනය
4. සහභාගිත්වය







# සෑම අයිතිවාසිකමකටම අදාළ මූලධර්ම



# ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි වගන්ති

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

I වන වගන්තිය

වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකු ම ළමයෙකු ලෙස සැලකේ.

3 වන වගන්තිය
ළමයින් සම්බන්ධ ව ක්‍රියා කරන විට දී සහ ඔවුන් පිළිබඳ ගන්නා තීරණවල දී ළමයාගේ උපරිම යහපත සලකා ක්‍රියා කළ යුතු ය.

6 වන වගන්තිය
ජීවත් වීම සඳහා අයිතියක් සෑම ළමයෙකුට ම ඇති බව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් පිළිගනියි.

7 වන වගන්තිය

ළමයෙකු උපත ලද විගස ම ලියාපදංචි කරනු ලබිය යුතු අතර, උපතෙහි සිට ම නමක් ලැබීමේ අයිතිය ද, ජාතියක් ලබා ගැනීමේ අයිතිය ද ඔහුට ඇත්තේ ය.

35 වන වගන්තිය

කිනම් කාර්යයක් සඳහා වුව ද කිනම් ආකාරයකින් වුව ද ළමයින් පැහැර ගෙන යෑම, විකිණීම හෝ වෙළඳාම් කිරීම වැළැක්වීමට රාජ්‍යයන් සියලු පියවර ගත යුතුය.

28 වන වගන්තිය

අධ්‍යාපනය ලැබීමට සියලු ම ළමයින්ට අයිතියක් ඇත. මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත් එය නොමිලයේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීමකි.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ඔබට ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලයේ අධ්‍යාපනය ලබා දීමට රජය පහසුකම් සලසා ඇත. එම අයිතිය ප්‍රයෝජනයට ගෙන හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමටත්, ඔබ ලබා ගත් දැනුම, කුසලතා රටේත්, ජන සමාජයේත් සංවර්ධනය සඳහා කැප කිරීමටත් අධිෂ්ඨාන කර ගන්න. එසේ වුවහොත් එම අයිතිය සම්බන්ධයෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට ඔබට හැකි වනු ඇත.

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අයිතිවාසිකම් ලබා දී ඇති ආකාරය














# ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග

ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදීම හා ඔවුන් පිළිබඳව ගනු ලබන සෑම තීරණයකදීම "ළමයාගේ උපරිම යහපත" සැලසෙන පරිදි කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ළමයින් සම්බන්ධ ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම සහ බලය පැවරීම
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම
- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම
- ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටු වීම. (Child Line Sri Lanka - 1929)

# ආබාධ සහිත පුද්ගලයන්



# ආබාධ සහිත පුද්ගලයන්











# ආබාධිත තත්ත්වයට පත්විය හැකි ආකාර

- ශාරීරික ආබාධ
- මානසික ආබාධ
- බුද්ධිමය විවිධතා






# ආබාධ සහිත පුද්ගලයන් තම දක්ෂතා වර්ධනය කර ගනිමින් රටට ගෞරවයක් අත්කර දෙන්නේය











# ආබාධ සහිත පුද්ගලයන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සදහා එක්සත් ජාතීන් පියවර ගෙන ඇත

- *ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ගරුකිරීම තුලින් ඔවුන්ට ගරුත්වයෙන් යුතු තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබාදීම පුරවැසියන් වශයෙන් අප සැමගේම යුතුකමකි.*



# ආදිවාසීන් හා ගෝත්‍රික ජන කොටස්











- ආදිවාසීන් හා ගෝත්‍රික ජන කොටස් ඔවුන්ට විශේෂිත සංස්කෘතියකට උරුමකම් කියයි
- ආදිවාසීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සදහා ලෝක කම්කරු සංවිධානය විසින් 1989 ආදිවාසී හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දී ඇත
- ශ්‍රී ලංකාවේ ජීවත් වන ආදිවාසීන් *වැදි ජනතාව* ලෙස හැඳින්වේ

# වැඩිහිටියන්














ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොයෙකුත් සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර ඇත. වැඩිහිටියන්ට තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අවස්ථාව සලසා දීම විශේෂයෙන් පවුල් ඒකකයේත්, ජන සමාජයේත් යුතුකමක් හා වගකීමක් වේ.

ආසියානු රටවල් අතුරින් අනාගතයේ දී ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය ඉහළ අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එනිසා ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු විය යුතු ය.

දේශීය වශයෙන් ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතක් (2000 අංක 09) සම්මත කර ඇත. ජාත්‍යන්තර මට්ටමෙන් ද වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර ඇත.

# කම්කරු අයිතිවාසිකම්



# කම්කරු අයිතිවාසිකම් පිළිබඳ ගෙන ඇති පියවර

- **1919 අන්තර්ජාතික කම්කරු සංවිධානය බිහිවීම**
- **1946 සිට අන්තර්ජාතික කම්කරු සංවිධානය එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම**
- **1948 දී ශ්‍රී ලංකාව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම**


AFP


www.hirufmnews.lk
www.sooriyanfmnews.lk
www.goldfmnews.lk

# ශ්‍රී ලංකාව සම්මත කරගෙන ඇති අණපනත්

- සාප්පු හා කාර්යාල සේවක පනත
- ප්‍රසූති ආධාර ආඥා පනත
- කාර්මික ආරවුල් පනත
- පඩි පාලක සභා ආඥා පනත
- සේවක අර්ථසාධක අරමුදල් පනත

# පාරිසරික අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්

"ධරණීය සංවර්ධනය සඳහා ප්‍රධාන වන්නේ මිනිසා ය. ස්වභාවධර්මය සමග සහයෝගිතාවෙන් කටයුතු කර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමේ සම්පූර්ණ අයිතිය ඔවුනට ඇත.

(පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනයේ 3 වන මූලධර්මය)



# පරිසර සංරක්ෂණයට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග

- පරිසර අමාත්‍යාංශය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# සුරකිමු පරිසරය









# ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන්හි වර්ධනය

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන්හි වර්ධනය

ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට (1972) මුල් වරට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීම මේ සම්බන්ධයෙන් ගනු ලැබූ වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකි ය. 1972 ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන ඇතුළත් වේ.


# මූලික අයිතිවාසිකම් කඩවූ විට ගතහැකි ක්‍රියාමාර්ග

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතු කොට ගෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න ව තිබීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීම ට හිමිකම් ඇත.
- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධ පැමිණිලි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත ද ඉදිරිපත් කළ හැකි ය.
- පරිපාලන ක්‍රියාවකින් සිදු වූ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා හෙවත් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කළ හැකි ය.

# ශ්‍රී ලංකාව මානව හිමිකම් භුක්ති විඳීම පිළිබඳ වර්තමාන තත්ත්වය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා තිබීම
- පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය ස්ථාපිත කොට තිබීම
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පිහිටුවා තිබීම
- ජාතික අධ්‍යාපන ආයතනය මගින් විෂය නිර්දේශවලට ඇතුලත් කර තිබීම
- විශ්ව විද්‍යාලවල පාඨමාලා පැවැත්වීම
- විවිධ ක්ෂේත්‍ර වලට අයත් රාජ්‍ය නිලධාරීන් මානව හිමිකම් පිලිබඳ දැනුවත් කිරීම

# අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්



# නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම්

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| රජය විසින් පනවන බදු ගෙවීම | පූජක උතුමන්ට ගරු කිරීම |
| නීති පිළිපැදීම | වැඩිහිටියන්ට සැලකීම හා රැක බලා ගැනීම |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට බැඳී තිබීම | සමාජ සිරිත් විරිත් වලට ගරු කිරීම |
| පොදු දේපල ආරක්ෂා කිරීම | පරිසරය සුරැකීම |
| ත්‍රස්තවාදය පිටුදැකීමට කටයුතු කිරීම | උරුමයන් හා ජාතික සම්පත් සුරැකීම |

# අප යුතුකම් ඉටු කරන්නේ කෙසේද?

- පවුලේ සාමාජිකයකු ලෙස යුතුකම් ඉටු කළ යුතුය
- පාසලේ සාමාජිකයකු ලෙස යුතුකම් ඉටුකළ යුතුය
- උසස් අධ්‍යාපන ආයතනයක සාමාජිකයකු ලෙස යුතුකම් ඉටුකළ යුතුය
- ඒකියාවක නියුක්ත වීමේදී ඊට අදාල යුතුකම් ඉටුකළ යුතුය

...මානව අයිතිවාසිකම් සුරකිමු...

....යුතුකම් ඉටුකරමු....

...එවිට ලොවම ලස්සන වෙයි...



**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 2 | 03. මානව හිමිකම් හා යුතුකම්<br>---ඇගයීම--- |

**සැකසුම: රුවනි නිරාෂා පතිරගේ**
**බප/හො/දොන් පේද්‍රික් මහා විද්‍යාලය**

1.මානව අයිතිවාසිකම් කෙටියෙන් හඳුන්වන්න

2. මානව අයිතිවාසිකම් පදනම්ව ඇත්තේ කිනම් මූලධර්ම මත පදනම්වද?

3. මානව අයිතිවාසිකම් සුරකින ජන සමාජයක දැකිය හැකි සාධනීය ලක්ෂණ තුනක් දක්වන්න

4. මානව අයිතිවාසිකම් දිනාගැනීම හා සම්බන්ධ ඓතිහාසික අවස්ථා තුනක් දක්වන්න

5. පළමුවන හා දෙවන ලෝක මහා සංග්‍රාම පැවති කාල පරිච්ඡේදය සඳහන් කරන්න

6. ලෝක මහා සංග්‍රාම හේතුවෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය වූයේ කෙසේද?

7. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1948 පෙබරවාරි 10 සම්මත කරගත් වැදගත් නීතිය කුමක්ද?

8. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි ඇතුලත් වන කරුණු දෙකක් ලියන්න

9. එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනීමේ මූලික අරමුණු මොනවාද?

10. මානව අයිතිවාසිකම් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න

11. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් දෙකක්ද ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් දෙකක්ද සඳහන් කරන්න

12. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් දෙකක් ලියන්න

13.එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබද අන්තර්ජාතික සම්මුතියෙහි පිළිගෙන ඇති අයිතිවාසිකම් හතරක් ලියන්න

14. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට අදාල ලේඛන හතරක් ලියන්න

15. කාන්තාව සම්බන්ධයෙන් ලිච්ඡවී රජදරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම දෙකක් ලියන්න

16. සීඩෝ සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමිවී ඇති අයිතිවාසිකම් හතරක් ලියන්න

17. ශ්‍රී ලංකාව කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද

18. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ ප්‍රධාන කරුණු හතරක් සඳහන් කරන්න

19. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

20. කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කර ඇති අණ පනත් නම් කරන්න

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 2 | 03. මානව හිමිකම් හා යුතුකම්<br>---පිළිතුරු--- |

සැකසුම: රුවනි නිරාෂා පතිරගේ
බප/හො/දොන් පේද්‍රික් මහා විද්‍යාලය

1. මිනිසත්බව ලැබීම නිසා කිසිදු භේදයකින් තොරව මිනිසාට උපතින්ම හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ.

2. සාධාරණත්වය, සමානාත්මතා මූලධර්මය

3. ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත වීම, පුරවැසියන්ගේ සමාජ ජීවිතය වැඩිදියුණු වීම, සමාජ යුක්තිය හා සාධාරණත්වය වර්ධනය වීම

4. ක්‍රි.ව 1215 බ්‍රිතාන්‍ය යේ මැග්නාකාර්ටා ගිවිසුම
   ක්‍රි.ව 1689 බ්‍රිතාන්‍ය යේ අයිතිවාසිකම් පිළිබඳ පනත
   ක්‍රි.ව 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
   ක්‍රි.ව 1789 මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
   ක්‍රි.ව 1917 රුසියානු විප්ලවය
5. පළමු ලෝක මහා සංග්‍රාමය- ක්‍රි.ව 1914-1918
   දෙවන ලෝක මහා සංග්‍රාමය-ක්‍රි.ව 1939-1945

6. ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ජීවිත අහිමි වීම
   විශාල පිරිසක් ආබාධිත වීම
   කාන්තාවන් හා ළමුන් මිලියන ගණනක් අනාථ භාවයට පත්වීම
   මිළ කළ නොහැකි තරම් දේපල හානි සිදුවීම

7. මානව හිමිකම් පිළිබද විශ්ව ප්‍රකාශනය

8. සියලුම මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇත
   ගරුත්වයෙන් හා අයිතිවාසිකම් වලින් සමාන වෙති

9. ලෝක සාමය සුරක්ෂිත කිරීම, ජාතීන් අතර සහයෝගය වර්ධනය කිරීමමානව හිමිකම් සුරැකීම

10. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්

11.

## මානව අයිතිවාසිකම්

### සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

- ජීවත් වීමට, නිදහස් ව සිටීමට හා පෞද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් දාසභාවයෙන් නිදහස් ව සිටීමට ඇති අයිතිය
- කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිලිවලින් මිදී සිටීමේ අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය
- ගමනාගමනයට ඇති නිදහස
- විදේශයක ආරක්ෂාව ලැබීමේ අයිතිය
- සිතීමේ හෘද සාක්ෂියේ හා ආගමික නිදහස
- නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය
- සෘජුව ම හෝ තෝරා ගත් නියෝජිතයකු මගින් තම රටේ පාලනයට සහභාගි වීමට ඇති අයිතිය

### ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- වැඩ කිරීමට ඇති අයිතිය, සමාන වැඩ සඳහා සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය
- වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට හා ඒවාට සම්බන්ධ වීමට ඇති අයිතිය
- නිවාඩු ලබා ගැනීමේ හා විවේක ගැනීමේ අයිතිය
- ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අයිතිය
- සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට සහභාගි වීමට ඇති අයිතිය
- සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
- පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය
- ප්‍රමාණවත් ජීවන තත්වයක් භුක්ති විඳීමට ඇති අයිතිය

12.

- ජීවත් වීමට ඇති අයිතිය
- කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හා වධ හිංසාවලින් මිදී සිටීමට ඇති අයිතිය
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- නීතිය හමුවේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමට ඇති අයිතිය
- අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- පෞද්ගලික නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් මිදී සිටීමට ඇති අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- ආගම් ඇදහීමේ නිදහස
- සාමකාමී ලෙස රැස්වීමේ නිදහස
- මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය
- මහජන නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීමට ඇති අයිතිය

13. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය
නිදහසේ රැකියාවක් කිරීමට ඇති අයිතිය
වැඩ කිරීමට ඇති අයිතිය
සාධාරණ වැටුපක් ලැබීමට ඇති අයිතිය
වෘත්තීය සංගම් පිහිටුවීමට හා ක්‍රියාකාරී වීමට ඇති අයිතිය

14. 1. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
2. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය (1966)
5. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ දෙවන වෛකල්පික සම්මුතිය (1989)
6. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පික සම්මුතිය (2008)

15. අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම, විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම

16. * කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

* පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්

* අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය

* ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය

* සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය

* සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය

17.

** මෙම සම්මුතියට අනුව 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම

** කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙන ම අමාත්‍යාංශයක් පිහිටුවීම

** කාන්තාවන්ට වන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව පිහිටුවීම

** ගැහැණු ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි ව සිදු කරන වැරදි දණ්ඩනීය අපරාධ වශයෙන් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම

** ගැහැණු ළමයින් හා කාන්තාවන්ට ද රැකවරණය සැලසෙන පරිදි ඔවුන්ට එරෙහි ව නිවස තුළ දී සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම

** සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම

18. 1 ආරක්ෂාව
2 පැවැත්ම
3 සංවර්ධනය
4 සහභාගිත්වය

19.

**ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග**

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදීම හා ඔවුන් පිළිබඳව ගනු ලබන සෑම තීරණයකදීම "ළමයාගේ උපරිම යහපත" සැලසෙන පරිදි කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ළමයින් සම්බන්ධ ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම සහ බලය පැවරීම
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම
- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම
- ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටු වීම. (Child Line Sri Lanka - 1929)

20.

සාප්පු හා කාර්යාල සේවක පනත, ප්‍රසූති ආධාර ආඥා පනත, කාර්මික ආරවුල් පනත,
පඩි පාලක සභා ආඥා පනත, සේවක අර්ථසාධක ආරවුල් පනත